## කින්නියා නගර සභාව
## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන 2010 ජුලි 02 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කින්නියා නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

1.3.1 **ගෙවියයුතු ගිණුම්.**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,939,238 ක් විය.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්.**

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වු ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.3,108,822ක් විය.

(ආ) **තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත නොකිරීම නිසා, එකතුව රු.580,233 ක් වු ගණදෙනු විගණනයේ දි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

විගණනයේ දි නිරීක්ෂණය වු එවැනි අවස්ථා පහත දැක්වේ.

| | | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|---|---|
| (අ) | | නගර සභා අඥා පනත (255 අධිකාරය) | |
| | (i) | 74 ජේදය | නගර සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිලි ඉදි කිරීමේ දි, මාර්ගවලට අදාළ ගොඩනැගිලි සීමාවන් සළකා බලා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | 121 හා 125 ඡේද | අනාරක්ෂිත හා අනවසර ඉදි කිරීම්වලට අදාළව පරීක්ෂා කර බලා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

(ආ) **නගර සභා පරිපාලන රීති.**

| | | |
|---|---|---|
| (i) | 90 ඡේදය | ප්‍රසිද්ධ මාර්ගවල සිදු වන ශබ්ද දූෂණ සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි. |
| (ii) | 73 ඡේදය | පොදු මාර්ග විශේෂයෙන් භාවිතා කරන්නන් සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි. |
| (iii) | 106 ඡේදය | ප්‍රසිද්ධ කාණු පද්ධතිය පිරිසිදු කිරීමට ක්‍රියා කර නොතිබුණි. |

(ඇ) **පළාත් සභා මූල්‍ය රීතී**

| | | |
|---|---|---|
| (i) | අංක 110 | පාඩු සඳහා ලේඛනයක් භාවිතා කර නොතිබුණි. |
| (ii) | අංක 133 | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. |
| (iii) | අංක 845 | දුරකථන ඇමතුම් සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (iv) | අංක 880 | මුදල්, තොග සහ අත්සන් කරන ලද චෙක්පත් හා වවුචර්පත් භාරව සිටින නිලධාරීන් ඇපකරයක් ලබා දී නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 අංක 10 දරන දේශිය ආදායම් පනත. | එකතුව රු.12,829 ක් වූ රඳවා ගැනීමේ බදු ගනුදෙනුකරුවන්ගෙන් අය කර ගෙන දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.1,289,307 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මව පුනරාවර්ථන වියදම රු.334,135 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය.**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ හිටි ආදායම්.**

සභාපතිවරයා විසින් සමාලෝචිත හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 436 | 382 | 2,038 | 450 | 164 | 2,186 |
| (ii) | බදු කුළී | 7,050 | 8,484 | -- | 7,370 | 2,867 | 1,873 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,117 | 483 | 3,528 | 635 | 556 | -- |
| (iv) | වෙනත් ආදායම් | 2,676 | 747 | -- | 21,190 | 12,410 | -- |

2.2.2 **උසාවි දඩ මුදල්**

විවිධ ආඥා පනත් යටතේ ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර, ප්‍රධාන ලේකම්, පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.181,262,095 ක් සභාවට ලැබියයුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3 **වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත රු.000 | 2010 තථ්‍ය රු.000 | 2010 විචලනය රු.000 | 2009 අයවැයගත රු.000 | 2009 තථ්‍ය රු.000 | 2009 විචලනය රු.000 |
|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 17,910 | 14,939 | 2,971 | 14,651 | 13,006 | 1,645 |
| අනෙකුත් | 5,096 | 3,512 | 1,584 | 3,547 | 3,473 | 74 |
| උප එකතුව | 23,006 | 18,451 | 4,555 | 18,198 | 16,479 | 1,719 |
| ප්‍රාග්ධන වියදම | 28,247 | 14,417 | 13,830 | 5,980 | 2,675 | 3,305 |
| මුළු එකතුව | 51,253 | 32,868 | 18,385 | 24,178 | 19,154 | 5,024 |

2.4 **මානව සම්පත් කළමණාකරණය**

2.4.1 **අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌනතාවය/ අතිරික්තය |
|---|---|---|---|
| මාණ්ඩලික | 02 | -- | 02 |
| ද්විතියික | 25 | 20 | 05 |
| ප්‍රාථමික | 27 | 13 | 14 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 43 | (43) |
| එකතුව | 54 | 76 | (22) |

2.5 <u>වත්කම් කළමනාකරණය.</u>

2.5.1 (අ) <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්</u>

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවති භෞතික සම්පත් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණවල දී අනාවරණය වූ වත්කම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | අයිතම | අයිතම සංඛ්‍යාව | කාලය | නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිතබව |
|---|---|---|---|---|
| (අ) | ඡායා පිටපත් යන්ත්‍රය (Koniya) | 01 | | |
| (ආ) | ෆැක්ස් යන්ත්‍රය (කැනන්) | 01 | | |
| (ඇ) | ලෙසර් ජෙට් ප්‍රින්ටරය | 01 | | නිශ්ක්‍රීය වත්කම් |
| (ඈ) | කැනන් කලර් ප්‍රින්ටරය | 01 | | |
| (ඉ) | UPS | 03 | අවුරුදු 02 | |
| (ඊ) | ප්ලාස්ටික් කැබිනට් | 02 | | |
| (උ) | මිටි | 46 | | |
| (ඌ) | සවල් | 37 | | ඌන උපයෝජිත වත්කම් |
| (එ) | ප්‍රින්ටර් LQ-2180 | 01 | | |

2.5.2 <u>ලැබිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.6,360,953 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.182,841 ක් විය.

2.5.3 <u>අයවීමට ඇති සේවක ණය</u>

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.800,686 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.122,421 ක් විය.

2.5.4 <u>සමීක්ෂණය නොකළ වත්කම්.</u>

භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.49,913,955 ක් විය.

2.6 <u>වාහන උපයෝජනය.</u>

සභාව සතු වාහනවල දෛනික ධාවන සටහන්වල ධාවන අවශ්‍යතාවයේ තොරතුරු, ධාවනය කළ දුර ප්‍රමාණය, ඉන්ධන ලීටරයකට ධාවනය කළ හැකි සාමාන්‍ය දුර ආදිය සහ මාසික කාර්යය සාධන සාරාංශ වැනි අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

2.7 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය